# 2026.01.26

# මහාසභා වාර්තාව

## පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

## පොළොන්නරුව

**2026.01.26 වන දින මහා සභා වාතර්ාව**
**පොළොන්නරුව ප්‍රාදේශීය සභාව.**

1. ගරු සභාපති - එච්.ජී.ජී වසන්ත කුමාර මැතිතුමා
2. ගරු උප සභාපති - එච්.එම්.සුනිල් කුලතිලක මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එල්.යූ. පාලිත කහඳ ලියනගේ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.එම්.ආතර් තෙන්නකොන් මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී. සුසන්ත ඉරෝෂ පුෂ්ප කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නලීම් මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.චින්තා ලක්මාලි වික්‍රමසිංහ මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.සමන් ගුණරත්න මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එ.එච් රිස්කාන් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්. දයාරත්න අමරසේකර මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.නිශ්ශංක විජේසූරිය මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.වී. අසංක රංජිත් දිසානායක මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්. ජගත් ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වී.ඉන්ද්‍රා නිල්මිණි විරසිංහ මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ආර්.යමුනා සංජිවනි මැතිනිය

**නොපැමිණි ගරු සභිකවරු -**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එල්.ආර්. අංජලිකා හසිනි මැතිනිය

**නිළධාරින් -**

1. ලේකම් - ඩබ්.එම්.පී.කෲස් මිය.
2. විෂය භාර නිළධාරි - ආර්.ඩී.එන්.එස්.කුමාරි මිය.

ගරු සභාපතිතුමා විසින් සියලු දෙනාටම සුභ උදෑසනක් ප්‍රාථර්නා කරමින් පැමිණ සිටි සියලුම ගරු මන්ත්‍රීවරුන්, ලේකම්තුමිය ඇතුළු නිළධාරීන් පිළිගනිමින් න්‍යාය පත්‍රය අනුව සභා කටයුතු ආරම්භ කිරිමට පෙර ආගම සිහිපත් කර මියගිය ත්‍රිවිධ හමුදා නිළධාරි සිහිපත් කර විනාඩියක නිහඬතාවය රකින ලදි.

**අ. පසුගිය සභා රැස්වීම් වාතර්ාව සභා සම්මත කිරීම.**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ 2025.12.30 වන දින පහත සංශෝධනය සහිතව මහා සභා වාතර්ා සභා සම්මත කිරිමට ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.එම්.සුනිල් කුලතිලක මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, සභා සම්මත කරන ලදි.

**සංශෝධනය -**

2025.12.30 වන දින මහා සභා වාතර්ාවේ 2 වන පිටුවේ පැමිණි ගරු සභිකවරුන් හා නොපැමිණි ගරු සභිකවරුන් සටහන් යොදා ඇති පරිච්ඡේදයේ පැමිණි ගරු සභිකවරුන්ගේ පහත දක්වා ඇති නම් නොපැමිණි කොටසේ සටහන් කර ඇති අතර එම කොටස සංශෝධනය කිරිමට සභාව තීරණය කරන ලදි.

**නොපැමිණි ගරු සභිකවරු -**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.චින්තා ලක්මාලි මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එල්.ආර්. අංජලිකා හසිනි මැතිනිය

3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - යු.ආර්.යමුනා සංජීවනි මැතිනිය

**පැමිණි ගරු සභිකවරු -**

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.එම්.චින්තා ලක්මාලි මැතිනිය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - යු.ආර්.යමුනා සංජීවනි මැතිනිය

ආ. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන **- නැත**

ඇ. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි සංනිවේදන සභාව ඉදිරියේ තැබීම **- නැත**

ඇ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න **- නැත**

ඉ. යථා පරිදි කල් දී ඇති යෝජනා

**ඉ (1) ගරු සභාපති එච්.ජී.ජී වසන්ත කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -**

1. **සභා පරිශ්‍රයේ ඇති මෝටර් බෝට්ටුව කලහගල මහජන පුස්තකාල පරිශ්‍රයේ ගාල් කිරිමට සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**<u>PPS/2026/01/26/ඉ/1</u>**

පොළොන්නරුව ප්‍රාදේශිය සභා පරිශ්‍රයේ ඇති මෝටර් බෝට්ටුව හදිසි ආපදා තත්ත්වයකදි භාවිතයට ගැනිමට හැකිවන පරිදි කලහගල මහජන පුස්තකාල පරිශ්‍රයේ ගාල් කිරිමට හා කලහගල කොට්ඨාස භාර සභිකවරුන් වෙත එම භාණ්ඩ වල වගකිම පැවරීමට ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.එම්.සුනිල් කුලතිලක මැතිතුමා වසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.සි.එල්.වික්‍රමසිංහ මැතිනිය විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

2. **පොළොන්නරුව ප්‍රාදේශිය සභාවේ වරිපනම් ලේඛණයට ඇතුලත් වී නොමැති දේපළ කිහිපයක් පොළොන්නරුව මහා නගර සභා ලේඛණයට ඇතුලත් කිරිම සම්බන්ධ නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති ලිපි සභාවට ඉදිරිපත් කිරිමේ යෝජනාව.**

**<u>PPS/2026/01/26/ඉ/2</u>**

පොළොන්නරුව ප්‍රාදේශිය සභාවේ වරිපනම් ලේඛණයට ඇතුලත් වී නොමැති දේපළ කිහිපයක් පොළොන්නරුව මහා නගර සභා ලේඛණයට ඇතුලත් කිරිම සම්බන්ධ නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව , 2018 වර්ෂයේ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරිමේ දි අංක 161 ගණන්ගොල්ල වසමට අයත් වරිපනම් දේපළ 13 ක් වරිපනම් ලේඛණයේ ඇතුලත් වි නොමැති බැවින් එම දේපළ පිළිබඳව තහවුරුවක් ලබාගෙන, ලේඛණ වලට ඇතුලත් කිරිමට ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා වසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.එච්.රිස්කාන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

3. **කායර්ාල පරිශ්‍රයේ ඉදිරිපස ඇති වාහන අංගනය කායර්ාලය පිටුපස ස්ථානගත කිරිමට සභාවේ අනුමැතිය ලබා ගැනිමේ යෝජනාව.**

**<u>PPS/2026/01/26/ඉ/3</u>**

පොළොන්නරුව ප්‍රාදේශිය සභා කායර්ාල පරිශ්‍රයේ ඉදිරිපස ඇති වාහන අංගනය කායර්ාලය ඉදිරිපස උද්‍යාන අලංකාරණ කටයුතු වෙනුවෙන් තාක්ෂණ නිළධාරි නිදේර්ශය මත කායර්ාලයේ පිටුපස ස්ථානගත කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.සමන් ගුණරත්න මැතිතුමා වසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.සි.එල්.වික්‍රමසිංහ මැතිනිය විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**4. සභාවේ කසල කළමණාකරන කටයුතු සඳහා ට්‍රැක්ටර් ටේලරයක් හා කසල ඇදීමේ අත් කරත්ත දෙකක් මිලදී ගැනීමට සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/4**

සභාවේ කසල කළමණාකරන කටයුතු විධිමත් පරිදි සිදු කිරිමට ප්‍රමාණවත් ට්‍රැක්ටර් රථ පහසුකම් නොමැතික හේතුවෙන් කසල ඇදීමේ කටයුතු ගැටළු සහගත බැවින්, ට්‍රැක්ටර් ටේලරයක් හා කසල ඇදීමේ අත් කරත්ත දෙකක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මිලදී ගැනීමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එල්.යු පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.කේ.එම්.එම්.ආතර් තෙන්නකොන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**5. 2026 වෂර්යට අදාළ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ අවසන් දිනය 2026.01.30 දක්වා දීසර් කිරිමට සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/5**

පොළොන්නරුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ආයතන හිමියන්ගේ වැඩි ඉල්ලුම අනුව 2026 වෂර්යට අදාළ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ අවසන් දිනය 2026.01.30 දක්වා දීසර් කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එල්.යු පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.කේ.එම්.එම්.ආතර් තෙන්නකොන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**6. සභා අරමුදල්, දෙපාතර්මේන්තු අරමුදල් හා අමාත්‍යාංශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරිමට යෝජිත සංවධර්න ව්‍යාපෘති වලට අදාළව මුදල් ලැබෙන තෙක් සභා අරමුදලින් කොටස් මුදලක් ගෙවිමට සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/6**

සභා අරමුදල්, දෙපාතර්මේන්තු අරමුදල් හා අමාත්‍යාංශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරිමට යෝජිත සංවධර්න ව්‍යාපෘති වලට අදාළව මුදල් ලැබෙන තෙක් සභා අරමුදලි 50% ක කොටස් මුදලක් ගෙවිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.එච්.රිස්කාන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**7. පලුගස්දමන කොට්ඨාසයේ වරිපනම් කලාපයට අයත් නොවන ග්‍රාමසේවා වසම්වල ඉල්ලීම් කරන ලද මහජනතාවගේ කසල රැස්කිරිමේ කටයුතු ආරම්භ කිරිමටත්, ඒ සඳහා අදාළ ගාස්තු අය කිරිමටත් සභාවේ අනුමැතිය ලබා ගැනිමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/7**

පලුගස්දමන කොට්ඨාසයේ වරිපනම් කලාපයට අයත් නොවන ග්‍රාමසේවා වසම්වල ඉල්ලීම් කරන ලද මහජනතාවගේ කසල රැස්කිරිමේ කටයුතු ආරම්භ කිරිමටත්, ආදායම් පරික්ෂක හා වැඩ පරික්ෂකගේ නිදෙර්ශය මත ඒ සඳහා අදාළ ගාස්තු අය කිරිමටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එල්.යු පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.කේ.එම්.එම්.ආතර් තෙන්නකොන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**8. පලුගස්දමන කොට්ඨාශයේ 176 හා 177 ග්‍රාමසේවා වසම් වල වරිපනම් කලාපයක් ලෙස ගැසට් නොකරන ලද කොටස් 173,174,175 වසම් හා සේවාගම නගර කොටස දියුණු කල ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරමින්, ගැසට් කිරිමට සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**<u>PPS/2026/01/26/ඉ/8</u>**

පලුගස්දමන කොට්ඨාශයේ 176 හා 177 ග්‍රාමසේවා වසම් වල වරිපනම් කලාපයක් ලෙස ගැසට් නොකරන ලද කොටස් 173 පලුගස්මදන 1 ඇළ, 174 පලුගස්දමන 2 ඇළ, 175 විජයරාපු ග්‍රාම සේවා වසම් හා 199 ශ්‍රී නිශ්ශංකමල්ලපුර හා 200 සේවාගම නගර කොටස දියුණු කල ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරමින් ගැසට් කිරිමටත්, ඉතිරි කොට්ඨාශ පිළිවෙලින් වරිපනම් කලාප ලෙස ගැසට් කිරිමට අදාළව ඉදිරි මහා සභා වාරයන් සඳහා යෝජනා ඉදිරිපත් කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි යූ.ජී. අසංක රංජිත් දිසානායක මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එ.කේ.එම්.එම්.ආතර් තෙන්නකොන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**9. මානව සම්පත් සංවධර්න සැලැස්ම අනුමත කිරිමේ යෝජනාව.**

**<u>PPS/2026/01/26/ඉ/9</u>**

මානව සම්පත් සංවධර්න සැලැස්ම අනුමත කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.කේ.එම්.එම්.ආතර් තෙන්නකොන් මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එ.එච්.රිස්කාන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**10. දුක් ගැනවිලි විසදාලිමේ සැලැස්ම.**

**<u>PPS/2026/01/26/ඉ/10</u>**

දුක් ගැනවිලි විසදාලීමේ සැලැස්ම අනුමත කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි කේ.එල්.යූ.පාලීත කහඳ ලියනගේ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්. දයාරත්න අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**11. අභ්‍යාන්තර ප්‍රතිපත්ති අනුමත කිරිමේ යෝජනාව.**

**<u>PPS/2026/01/26/ඉ/11</u>**

සභාව විසින් සකස් කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති අනුමත කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි කේ.ජී.සුසන්ත ඉරෝෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

I. අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන්වූවන් ආවරණය කිරිමේ ප්‍රතිපත්තිය.
II. අවිධිමත් ව්‍යාපාර ආවරණ කිරිමේ ප්‍රතිපත්තිය.
III. විශේෂ අවශ්‍යතා සහිත පුරවැසියන් ආවරණය කිරිම සඳහා වන ප්‍රතිපත්තිය.
IV. වරප්‍රසාද නොළත් කණ්ඩායම් සවිබල ගැන්ම සහ වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය.
V. පොළොන්නරුව ප්‍රාදේශිය සභාවේ පරිසර ප්‍රතිපත්තිය.
VI. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශේෂ පිළිගැනිමක් ලබා දීම සඳහා වන ප්‍රතිපත්තිය.
VII. පොළොන්නරුව ප්‍රාදේශිය සභාවේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පිළිබඳ සමානාත්මක ප්‍රතිපත්තිය.
VIII. සභාව සතු පොළ භූමි සහ වෙළඳ පොළ අවශ්‍යතාවන් ලබා දීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිය.

**12. ජංගම වැසිකිළි සකස් කර මහජන සේවාව ලබා දීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/12**

පොළොන්නරුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවය සඳහා තාක්ෂණ නිළධාරි විසින් විශේෂ ආකෘතියකට අනුව ජංගම වැසිකිළි සකස් කර මහජනයා වෙත සේවාව ලබා දීමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.සුසන්ත ඉරෝෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**13. ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්යය සාධනය මත පදනම් වු ප්‍රාග්ධන ප්‍රදාන ලබා දිම යටතේ (රු.මිලියන 10 - රු.මි 20 දක්වා )**

**PPS/2026/01/26/ඉ/13**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/PL/01/CGLA හා 2026.01 දින රහිත ලිපිය අනුව, පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වු ප්‍රාග්ධන පදාන ලබා දීම යටතේ පහත ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.චින්තා ලක්මාලි මැතිනිය විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එල්.යු.පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

I. ප්‍රාදේශිය සභා කාර්යාලය ඉදිරිපිට දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආපන ශාලාවක් ඉදිකිරිම.
II. සේවාගම ආයුවේර්ද මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ කුලි පදනම මත ඉදිකිරිම් උපකරණ ලබා දීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරිම.
III. සේවාගම මහජන පුස්තාකල ගොඩනැගිල්ලලේ තුන්වන මහළ සංවර්ධනය කිරිම.

**14. සභාවේ 2026 අයවැය ලේඛණය, පුරවැසි ප්‍රඥප්තිය, සභා රැස්විම් වාර්තා හා වැදගත්වන ආකෘති පත්‍ර දෙමළ භාෂාවෙන් පරිවර්තනය කිරිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ භාෂා පරිවර්තකගේ සහය ලබා ගැනිම හා අදාළ ගෙවිම් කිරිමටත් සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/14**

සභාවේ 2026 අයවැය ලේඛණය, පුරවැසි ප්‍රඥප්තිය, සභා රැස්විම් වාර්තා හා වැදගත්වන ආකෘති පත්‍ර දෙමළ භාෂාවෙන් පරිවර්තනය කිරිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ භාෂා පරිවර්තකගේ සහය ලබා ගැනිම හා අදාළ ගෙවිමටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.එච්.රිස්කාන් මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.සුසන්ත ඉරෝෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**15. මහජන පුස්තකාල සඳහා රෝද පුටු හා ප්‍රවේශ මාර්ග සකස් කරමින් විශේෂ අවශ්‍යතාව සහිත පුද්ගලයින්ට පුස්තකාල භාවිතය සඳහා අවස්ථාව ලබා දීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/15**

මහජන පුස්තකාල සඳහා රෝද පුටු ලබා දිමටත්, ප්‍රවේශ මාර්ග සකස් කරමින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට පුස්තකාල භාවිතය සඳහා අවස්ථාව ලබා දිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.කේ.එම්.එම් තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**16. ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය අනුමත කිරිමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/16**

ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය අනුමත කිරීමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.සමන් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.එම්.සුනිල් කුලතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

**17. සිව් අවුරුදු සැලැස්ම සකස් කිරිම හා සියළු කොට්ඨාස වලින් අවශ්‍යතා හදුනා ගැනීමේ යෝජනාව.**

**PPS/2026/01/26/ඉ/16**

**සියළු කොට්ඨාස වලින් අවශ්‍යතා හදුනා ගනිමින් සිව් අවුරුදු සැලැස්ම සකස් කිරිමට** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.සමන් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.එම්.සුනිල් කුලතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සම්මත කරන ලදි.

ඊ (01) <u>කාරක සභා වාතර්ා අනුමැතියට ඉදිරිපත් කිරිම.</u>

1. <u>නිවාස හා ප්‍රජා සංවධර්න වාතර්ාව ඉදිරිපත් කිරිම -</u>

2026.01.12 වන දිනැති නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාතර්ාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව. නිදේශයන් සලකා බලා පහත සදහන් තිරණ ගැනිමට ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.එම්.සුනිල් කුලතිලක මැතිතුමා යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.සමන් ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව සභා සම්මත විය.

**PPS/2026/01/26/ඊ01/1/I**

ආගමික වැඩසටහන් යටතේ වෙන්කර ඇති රු.500000.00 ප්‍රතිපාදන යටතේ රු.350000.00 ක මුදලින් පෙසොන් පොහොය නිමිතිකර ගෙන බලප්‍රදේශයේ පාසල් දරුවන් අතර භක්තිගිත තරගයක් සංවිධානය කිරිමටත්, රු.150000.00 ප්‍රතිපාදන යටතේ මුස්ලිම් පල්ලියේ පවත්වන දහම්පාසල් තරගයක් පැවැත්විමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/II**

ප්‍රජා සංවධර්න වැඩසටහන් යටතේ වෙන්කර ඇති රු.750,000.00 ප්‍රතිපාදන යටතේ තෝරාගත් අඩු ආදායම් ලාභි එක් පවුලක් සඳහා රු 75,000.00 බැගින්, පවුල් 10 ක් සඳහා තම නිවසේ වහලය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දිමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/III**

ප්‍රජා සංවධර්න වැඩසටහන් යටතේ වෙන්කර ඇති රු.750,000.00 ප්‍රතිපාදන යටතේ බල ප්‍රදේශයේ එක් සුසාන භූමියක් සඳහා රු.25,000.00 වියදම් සිමාවේ, ලියාපදිංචි මරණාධාර සමිතියක් වෙතින් ගමේ සුසාන භූමියේ අවශ්‍යතාව අනුව අළුත්වැඩියා කටයුතු හෝ අවශ්‍ය වන වෙනත් කටයුතු සඳහා සහාය ලබා දීමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/IV**

පුස්තකාල වැඩසටහන් යටතේ ඇති රු.200000.00 ප්‍රතිපාදන යටතේ එක් පුස්තකාලකට රු.50000.00 වන සේ පුස්තකාල වාෂරීක සැලසුම අනුව පාඨක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා පුස්තකාල වෙත ප්‍රතිපාදන ලබා දිමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/V**

කලහගල මහජන පුස්තකාලය ප්‍රජාවට ආකශර්නිය ස්ථානයක් බවට පත් කිරිමට අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරිමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/VI**

ලක්ෂ උයන පුස්තකාලය, අඹන්ගඟ පෙර පාසල් වැට, විජයරාජපුර පෙර පාසැල වටා වැට ඉදිකිරිම් කටයුතු සිදු කිරිමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/VII**

බල ප්‍රදේශයේ කාන්තා සවිබල ගැන්විම සඳහා වෙන්කර ඇති රු 500,000.00 ක මුදලින් මත් උවදුර පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරිමේ වැඩසටහන් 10 ක් සංවිධානය කිරිමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/VIII**

සාහිත්‍ය මස වැඩසටහන් රු.200000.00 යටතේ බල ප්‍රදේශයේ පාසල් අතර දැනුම මිනුම තරගයක් පැවැත්විමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/IX**

ආබාධිත පුද්ගල සංවධර්න ප්‍රතිපාදන රු.100000.00 යටතේ පළුගස්දමන ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින මධ්‍යස්ථානයේ නිරික්ෂණයකින් පසු හඳුනා ගන්නා අවශ්‍යතාවන් සපුරා දිමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/X**

ආයුවෙර්ද ජංගම සේවා වසම් මට්ටමින් පැවැත්විමට කටයුතු සංවිධානය කිරිමටත් ඒ සඳහා ඖෂධ ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ ලබාගැනිමට යෝජනා කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/XI**

වැඩිහිටි පුද්ගල සංවධර්න සංවධර්න වැඩසටහන් යටතේ වෙන්කර ඇති 500,000.00 ක මුදලින් බල ප්‍රදේශයේ වැඩිහිටි සමිති 10 ක ඉල්ලිම අනුව රසවින්දනාත්මක වැඩසටහන් 10 ක් පැවැත්විමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/XII**

ක්‍රිඩා ප්‍රවධර්න කටයුතු සඳහා වෙන්කර ඇති රු 200,000.00 ක මුදලින් බල ප්‍රදේශයේ ක්‍රිකට් ක්‍රිඩා කණ්ඩායම් අතර එක් දින ක්‍රිකට් තරගයක් පැවැත්විමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/1/XIII**

වැසිකිළි ආධාර රු.500000.00 ප්‍රතිපාදන යටතේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා වැසිකිළි ආධාර කොට්ඨාසයකට එක බැගින් රු.50000.00 වියදම් සීමාවේ ද්‍රව්‍යමය ආධාර හෝ මුල්‍යමය ආධාර ලබා දීමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/1/XIV**

ව්‍යවසායකත්ව සංවධර්න ප්‍රතිපාදන රු.1000000.00 යටතේ බල ප්‍රදේශයේ දැනට ස්වං රකියාවක් පවත්වාගෙන යන ව්‍යවසායකයින් 10 දෙනෙකු දිරිමත් කිරීමේ වැඩසටහනක් ලෙස එම ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය හෝ උපකරණ ලබා දීමට නිවාස කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**2. කාමරීක සේවා උපදේශක කාරක සභාව ඉදිරිපත් කිරීම -**

2026.01.12 වන දිනැති කාමරීක සේවා උපදේශන කාරක සභා කමිටු වාතර්ාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව. නිදෙර්ශයන් සලකා බලා පහත සඳහන් තිරණ ගැනිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එල්.යු පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව සභා සම්මත විය.

**PPS/2026/01/26/ි01/2/I**

2026 වෂර්යේ සභා අරමුදල් යටතේ 04 වන වැඩ සටහන අනුව ප්‍රධාන කායර්ාලය ඉදිරිපිට වාහන අංගනය ගලවා කායර්ාලය පිටුපස ස්ථාපනය කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/2/II**

2026 වෂර්යේ සභා අරමුදල් යටතේ 04 වන වැඩ සටහන අනුව ප්‍රධාන කායර්ාලය ඉදිරිපිට වැට සකස් කිරීම II වන අදියරයට අදාල ඇස්තමේන්තු සකස් කර අනුමත කරවා ගැනීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/2/III**

2026 වෂර්යේ සභා අරමුදල් යටතේ 04 වන වැඩ සටහන අනුව සේවාගම වාහන නැවතුම්පළ ඉදිකිරීම II වන අදියරයට අදාල ඇස්තමේන්තු සකස් කර අනුමත කරවා ගැනීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/2/IV**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව සතුව පවතින කුළි පදනම මත ලබා දීමට තීරණය කරන ලද යන්ත්‍ර උපකරණ වලට අදාල මිළ ගණන් සභාව විසින් පත් කරන ලද කමිටුව විසින් තීරණය කර ක්‍රියාත්මක කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/2/V**

2026 සභා අරමුදල් 04 වන වැඩ සටහන යටතේ ප්‍රධාන කායර්ාලයේ උඩු මහල වායුසමනය කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/2/VII**

2026 සභා අරමුදල් 07 වන වැඩ සටහන (සුභ සාධක) යටතේ පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් 02හි ආරක්ෂිත වැට ඉදිකිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරීමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ි01/2/VIII**

සේවාගම පොළ භූමියෙහි පැවැති වැසිකිළි පද්ධතිය සඳහා ආරක්ෂිත දැල් ආවරණයක් ඉදිකිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/IX</u>**

දේශීය ණය හා සංවධර්න අරමුදලින් ප්‍රතිපාදන ලබා ගනිමින් ප්‍රධාන කායර්ාලය සඳහා සූයර් පැනල් සවි කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/X</u>**

සේවාගම මහජන පුස්තකාලයෙහි ඉහල මහල දැල් ආවරණය කර පිටතින් පඩි පෙළක් යොදා කුලි පදනම මත ලබා දීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/XI</u>**

සේවාගම වෙළඳ සංකීණර් ගොඩනැගිල්ලෙහි ඉහල මහලේ හා පහල මහලේ පවතින ජනෙල් සඳහා ග්‍රිල් යොදා සකස් කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/XII</u>**

සේවාගම ආයුවෙර්දය අසල පැරණි ගොඩනැගිල්ල අළුත්වැඩියා කර කුළි පදනම මත ලබාදීමට තිබෙන උපකරණ ගබඩා කර තැබීමට ස්ථානය සකස් කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/XIII</u>**

ආපදා සඳහා මාගර් නඩත්තුව සඳහා ලබා දුන් ප්‍රතිපාදන මගින් ලබා ගත් කුට්ටි ගල් යොදා ගනිමින් සභා බල ප්‍රදේශයේ පවතින මීටර් 25ට අඩු මාගර් සකස් කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/XIV</u>**

සභා බල ප්‍රදේශයේ ආපදාවට ලක් වූ බෝක්කු අළුත්වැඩියා කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/XV</u>**

කසළ බැහැර කිරීම සඳහා බක්කි 02ක් සහ ට්‍රැක්ටර් ටේලරයක් සකස් කිරීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**<u>PPS/2026/01/26/ඊ01/2/XVI</u>**

කායර්ාලය පිටුපස වාහන අංගනය සකස් කිරීම සඳහා රු.100,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීමට කාමරීක කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**3. පරිසර හා සෞඛ්‍ය පහසුකම් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව ඉදිරිපත් කිරීම -**

2026.01.12 වන දිනැති පරිසර හා සෞඛ්‍ය පහසුකම් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව වාතර්ාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව. නිදෙර්ශයන් සලකා බලා පහත සඳහන් තිරණ ගැනිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ආර්.එම්.දයාරත්න අමරසේකර මැතිතුමා යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි කේ.එල්.යූ පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව සභා සම්මත විය.

**<u>PPS/2026/01/26/ඊ01/3/I</u>**

2026 වෂර්ය සඳහා සෞඛ්‍ය සේවා යටතේ මුදල් වෙන්කර ඇති පහත වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට පරිසර කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

- බෝවන හා බෝනොවන රෝග පාලනය
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා
- මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන්
- සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්
- කසළ කළමණාකරණය
- පරිසර වැඩසටහන්

**PPS/2026/01/26/ප01/3/II**

කොට්ඨාශ 09 ම ආවරණය පරිදි නොදිරණ කසළ ඉවත් කිරීම සඳහා කාලසටහනකට අනුව කටයුතු කිරීම.එහිදි වැඩිදුරටත් කමිටුව නිදෙර්ශ කලේ කලින් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකාවක් සකස් කර මහජනතාවට ලබාදීමට පරිසර කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ප01/3/III**

ග්‍රාමීය ප්‍රජා සංවිධාන ප්‍රධාන නිලධාරීන් කැඳවා ඉහත අංක එක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබාගැනීමට පරිසර කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ප01/3/IV**

අනතුරුදායක ගස් හදුනාගෙන එවා ඉවත් කිරීම සඳහා අදාල අංශ වෙත ඉදිරිපත් කිරීමට පරිසර කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ප01/3/V**

සුනඛ එන්නත්කරන වැඩසටහනක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා එක්ව සෑම කොට්ඨාශයේම ක්‍රියාත්මක කිරීමටත්, එ සඳහා වන වියදම දැරීමටත් පරිසර කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**4. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ උපදේශක කාරක සභා වාතර්ාව ඉදිරිපත් කිරිම -**

2026.01.19 වන දිනැති **මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ උපදේශක කාරක සභා වාතර්ාව** ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව. නිදෙර්ශයන් සලකා බලා පහත සඳහන් තිරණ ගැනිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.කේ.එම්.එම් තෙන්නකෝන් මැතිතුමා යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එල්.යු පාලීත කහඳ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව සභා සම්මත විය.

**PPS/2026/01/26/ප01/4/I**

බැඳිවැව පුස්තකාලයට හා ශ්‍රවණාගාරයේ මේස සඳහා අවශ්‍ය විනිවිධ පෙනෙන පොලිතින් මිලදී ගැනීම සහ කායර්ාලයට අවශ්‍ය ලීටර 20 වතුර බෝතල 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෝල්සිටි සප්ලයසර් ආයතනය වෙත රු.11,804.72 ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ප01/4/II**

ආපදා පවිත්‍රතා සහ ඩෙංගු මර්දන වැඩසටහන සඳහා 6*3 ප්‍රමාණයේ බැනර් 06ක් මුද්‍රණය කර ගැනීම වෙනුවෙන් ශාන්ති ලංකා හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම වෙත රු.13,500.00ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/III**

සභා කායර්ාලයේ පවතින කැනපිය සඳහා වහල ආවරණය සකස් කිරිමට blue full curve තහඩු මිලදී ගැනීම වෙනුවෙන් එන්.එස්.බී.රුෆින් පුද්ගලික සමාගම වෙත රු.91,460.00 ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/IV**

2025 දෙසැම්බර් මාසයට අදාලව සභාවට අයත් වාහන හා යන්ත්‍ර සඳහා ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් සී/ස පලුගස්දමන විවිධ සේවා සමූපාකාර සමිතිය වෙත රු.1,081,882.00 ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/V**

කායර්ාලයේ භාවිතා කරන ඇඟිලි සළකුණු යන්ත්‍රය අළුත්වැඩියා කිරිමේ වාෂරීක සේවා ගිවිසුම අනුව සිලෝන් බිස්නස් ඇප්ලයන්ස් පුද්ගලික සමාගම වෙත රු.9,801.03 ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/VI**

කායර්ාලයේ භාවිතා කරන කියොසීරා ෆොටෝ කොපි යන්ත්‍රය අළුත්වැඩියා කිරිමේ වාෂරීක සේවා ගිවිසුම අනුව KD COMPUTER TECHNOLOGIES ආයතනය වෙත රු.21,000.00ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/VII**

පොළොන්නරුව ප්‍රා/සභා ප්‍රධාන කායර්ාලයේ වැසිකිළි පද්ධතියේ අලුත් වැඩියාව සඳහා PVC බට 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.25,000.00ක් නිව් සිටි හාඩ්වෙයාර් වෙත ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/VIII**

කායර්ාලයේ මහේෂි මිය භාරයේ ඇති ඩෙල් වගර්යේ ලැප්ටොප් පරිඝනකය අළුත්වැඩියා කිරිම වෙනුවෙන් P&P SEWING MACHIN AND COMPUTER SOLUTIONS වෙත රු.32,200.00 ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/IX**

සභාවට අයත් පුස්තකාල 04 සඳහා ප්‍රදශර්න පුවරු 04 ක් මිළදී ගැනීම සඳහා ශාන්ති ලංකා හෝල්ඩින්ග්ස් ආයතනය වෙත රු.28,000.00ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ð01/4/X**

කායර්ාලයේ මහේෂි මිය භාවිතා කරනු ලබන SAMSUNG M 2020 වගර්යේ මුද්‍රණ යන්ත්‍රය අළුත් වැඩියා කිරිම සඳහා P&P SEWING MACHIN AND COMPUTER SOLUTIONS වෙත රු.12,200.00 ක් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XI**

වන අලි ප්‍රහාරයට ලක් වූ ගල්ලෑල්ල කඩ කාමර වල කුලී බිල්කල වටිනාකමෙන් ඉවත් කිරිම සම්බන්ධව ආදායම් විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය මහ සභාව වෙත යොමු කිරීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XII**

ගල්ලෑල්ල පුදූර් හංදිය මිණිමුතු ත්‍රීවිල් සංගමය සඳහා ස්ටිකර් කාඩ්පත් මුද්‍රණය කර ගැනිම සම්බන්ධව ආදායම් විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය අනුව අදාල ස්ටිකර් කාඩ්පත් මුද්‍රණය කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XIII**

බැදිවැව මහජන පුස්තකාලයේ රැහැන් රහිත අන්තජර්ාල සම්බන්ධතාවය නැවත ලබා ගැනීම සම්බන්ධව විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය අනුව අදාල අන්තජර්ාල සම්බන්ධතාවය නැවත ලබාදීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XIV**

ජංගම වෛද්‍ය කුටි අංක 04 සහ 05 සඳහා ලාංඡන ගැසීම සම්බන්ධව ආදායම් විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය අනුව අදාල ලාංඡන සභාවේ වියදමින් සිදු කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XV**

සේවාගම වෛද්‍ය සංකීර්ණයේ පහල මහලේ හිඟ ජල බිල්පත පියවීම සම්බන්ධව විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය අනුව අදාල හිඟ මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවන ලෙස ලිඛිතව දැනුම්දීමටත් එසේ ගෙවීමට අපොහසත් වන්නේ අසාධු ලේඛන ගත කිරිමට කටයුතු කරන බව දැනුම් දීමටත් මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XVI**

දියමංපාලම ළමා උද්‍යානයේ හිඟ ජල හා විදුලි බිල්පත් වල මේ දක්වා හිඟය පියවීම සම්බන්ධව විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය අනුව අදාල හිඟ මුදල් සභාව මඟින් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XVII**

2026.01.12 ප්‍රසම්පාදන කමිටුවේදී මිලදී ගැනීම සඳහා අනුමැතිය ලද ඇඟිලි සළකුණු යන්ත්‍ර 04,ග්‍රයින්ඩර් මැෂින් 01,PORTABLE HARD DISK 01,වාහන සඳහා GPS යන්ත්‍ර12, ක්ෂේත්‍ර රාජකාරී ඉටුකරන සෞඛ්‍ය හා මාගර් කම්කරුවන්ට අනියම් තාවකාලික ස්ථිර පදනම නොසලකා නිල ඇඳුම් කට්ටල 02 ක් කාර්යාලයේ සියළු සේවකයින්ට ටීෂටර්යක් ,අඩි 15 ක් දිග කේබල් 01 මිලදී ගැනීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ස01/4/XVIII**

සේවාගම ආයුවේද් මධ්‍යස්ථානයේ හිඟ විදුලි බිල්පත පියවීම සම්බන්ධව විෂය නිලධාරී ඉදිරිපත් කල ලිපිය අනුව අදාල හිඟ මුදල ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XIX**

මෝටර් ග්‍රේඩර යන්ත්‍රය සඳහා පැය 1000 සම්පූණර් සේවා කිරිම වෙනුවෙන් නියෝජිත ආයතනයෙන් ලද මිළ ඇස්තමේන්තුව සේවාව සිදු කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XX**

2024 දෙසැම්බර් මාසයේ වන අලි ප්‍රහාරයට ලක් වී වසා දමන ලද ගල්ලැල්ල වැසිකිළි පද්ධතිය හා ගල්ලැල්ල පොලෙහි බිල්කල වටිනාකම් ඉවත් කිරිම හා එ අනුව ගිණුම්ගත තොරතුරු නිවැරදි කිරිමට අදාළ ලිපිය මහ සභාව වෙත යොමු කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXI**

සභාව සඳහා ජංගම වැසිකිළි 03 ක් මිලදී ගැනීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි

**PPS/2026/01/26/ඊ01/4/XXII**

සභාවේ web site එකේ සංවධර්නය  කිරීම සඳහා යම් වියදමක් දැරීමට සිදුවුව හොත් එම මුදල් සභා අරමුදලින් දැරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXIII**

2026 වාෂර්ික අයවැය ලේඛනය , 2025 මූල්‍ය ප්‍රකාශන සහ පුරවැසි ප්‍රඥප්තිය හා වැදගත් වන ආකෘති පත්‍ර  සඳහා දෙමළ මුද්‍රණයක් සිදු කිරිම මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXIV**

බැඳිවැව සහ සේවාගම මහජන පුස්තකාල සඳහා කසල වෙන් කරන බඳුන් කට්ටල ලබා දීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXV**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කසල ගැණුම්කරුවන්ගෙන් මිළ ගණන් කැදවා වැඩිම මිළ ලබාදෙන ගැණුම්කරුට සභාවේ කසල ලබාදීමටත්, දැනට ගබඩාවේ රැස්ව ඇති කසල වාහම දිස්ත්‍රික්කය තුළ  කසල ගැනුම්කරුවෙකු වෙත ලබාදෙමින් කසල ගබඩාවේ ඉඩ සකස් කර ගැනිමටත් මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXVI**

සේවාගම වෙළඳ සංකීණර්යේ පහත මහළ  ඉල්ලුම් කර ඇති ගැණුම්කරුට තක්සේරු කරන ලද මිළ යටතේ මාස 06 ක කාලයක් සඳහා ලබාදීමට සහ එසේ ලබාදීමේදී මාස 03 ක රැදවුම් මුදලක් ලබාගැනීමටත් ,එහි පැවැත්ම අනුව සලකා බලා ඉදිරියටත් මහල ලබා දීම සම්බන්ධව තීරණය කිරිමට  මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XVII**

වරිපනම් නොවන කලාප සඳහා කසල ගාස්තුවක් අයකර අදාල සේවාව ලබාදීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XVIII**

දෙපාතර්මේන්තුව, අමාත්‍යාංශ හෝ සභා අරමුදල් යටතේ සිදුකරනු ලබන ව්‍යාපෘති සඳහා එම අරමුදල් ලැබෙන තෙක් අදාල ව්‍යාපෘතිය නිම කරන ලද කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවිය යුතු මුදල් වලින් 50% ක සීමාවක් දක්වා සභා අරමුදලින් ගෙවීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXIX**

සභාව සතු බැදිවැව සහ සේවාගම කලහගල හා ලක්ෂ උයන මහජන පුස්තකාල සඳහා අබාධිත ප්‍රවේශයන් ඉදි කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXX**

පහත සඳහන් වසම් සහ ස්ථාන දියුණු කල ප්‍රදේශයක් ලෙස නම්කර ගැසට් මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXXI**

පලුගස්දමන 176/177 ග්‍රාම නිලධාරී වසම් වලට අයත් දැනට නම් කර නොමැති ප්‍රදේශ සහ 173,174,175 ග්‍රාම නිලධාරී වසම්

- සේවාගම නගර කොටස
- ගල්ලැල්ල ග්‍රාම නිලධාරී වසම 02
- 198 ලක්ෂ උයන
- ඇතුමල්පිටිය

**PPS/2026/01/26/ඊ01/4/XXXII**

සේවාගම මහජන පුස්තකාලයේ අවුරුදු 06 ක කාලයක සිට ඉවත් කර ඇති පුවත්පත් අළුත් ,පරණ ලෙස වෙන් කිරිමකින් තොරව කිලෝ 01ක් රු.10.00 ක මිල යටතේ අදාල ගැණුම්කරුට ලබා දීමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ01/4/XXXIII**

සභාවට අයත් පුස්තකාල සඳහා පුවත්පත් මිලදි ගැනීම වෙනුවෙන් පහත සඳහන් පරිදි බිල්පත් වටිනාකම් ගෙවීම් කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

| අ.අ | පුස්තකාලය | විස්තරය | බිල්පත් අංකය | මුදල රු. | මුදල් ගෙවන අයගේ විස්තර |
|---|---|---|---|---|---|
| 1 | සේවාගම මහජන පුස්තකාලය | 2025 දෙසැම්බර් | 846 | 3420.00 | ආර්.ජී.ජී.ගුණසේකර |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | කලහගල මහජන පුස්තකාලය | 2025 දෙසැම්බර් | 1047 | 2410.00 | පුවාසා පොත් මැදුර |
| 3 | බැඳිවැව මහජන පුස්තකාලය | 2025 දෙසැම්බර් | 1049 | 3060.00 | පුවාසා පොත් මැදුර |

**PPS/2026/01/26/ඊ01/4/XXXIV**

මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද පහත වවුචපර්ත් අනුමත කිරිමට මුදල් කමිටුව විසින් ගත් නිදෙර්ශය අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

- 2026 ජනවාරි මස ලියාපදිංචි තැපැල් පහසුකම හා සාමාන්‍ය තැපැල් පහසුකම සඳහා රු.15,000.00ක් සහ 2025.12.31 දිනට හිඟ තැපැල් ගාස්තුව රු.8,960.00 ක් පොළොන්නරුව තැපල් කායර්ාලය වෙත ගෙවීම
- රා.ප.ච.04/2026 සහ 2026.01.13 දිනැති ලිපිය අනුව කායර්ාලයේ නිලධාරීන් 09 දෙනෙකු සඳහා උත්සව අත්තිකාරම් මුදල් රු.15,000.00 බැගින් ලබා දීම.
- කායර්ාලයේ නිලධාරීන් 39 දෙනෙකු සඳහා විශේෂ අත්තිකාරම් මුදල් රු.4,000.00 බැගින් ලබා දීම.

ඊ (02) <u>වෙනත් කමිටු</u>

**1. ප්‍රසම්පාදන කමිටු වාතර්ාව ඉදිරිපත් කිරිම .**

2026.01.12 වන දිනැති ප්‍රසම්පාදන කමිටු වාතර්ාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව. නිදෙර්ශයන් සලකා බලා පහත සඳහන් තිරණ ගැනිමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි කේ.එල්.යු.පාලිත කහඳ ලියනගේ මැතිතුමා යෝජනා කරන ලද අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එ.එච්.රිස්කාන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව සභා සම්මත විය.

**PPS/2026/01/26/ඊ02/1/i**

ගබඩා විෂය විසින් ඉල්ලුම් කර ඇති 2024.12.31 භාණ්ඩ සමීක්ෂණ වාතර්ාවේ යෝජනා හා නිදෙර්ශ අනුව පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාලවල පවතින පුවත්පත් අපහරණය කිරීම සඳහා පවතින වෙළඳපොල මිල සමග ගලපා විකිණීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ02/1/ii**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් ගේඩර් යන්ත්‍රයේ සම්පූණර් සේවාව කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඩිමෝ (DIMO) ආයතනය වෙතින් සිදු කිරීමට උතුරුමැද පළාත් යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබා දුන් නිදෙර්ශ පරිදි ඉදිරි කටයුතු කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ02/1/iii**

උතුරුමැද පළාත් යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබා දුන් නිදෙර්ශ පරිදි පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් PF – 7759 කැබ් රථයට අවශ්‍ය විල් බ්‍රෂ් 01ක් සහ හයිඩ්‍රොලික් ජැක්

01 ක් සෘජු මිලදී ගැනීම යටතේ ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/iv**

කායර්ාලයේ සේවයේ නියුතු පී.පී.තරංගා මිය සහ පී.ජී.එස්.ඒ.කුමාරි මෙය විසින් ඉල්ලුම් කර ඇති ප්‍රින්ටර් යන්ත් 02 ක සඳහා දැනට සභාව තුල පවතින ප්‍රින්ටර් යන්ත්‍ර අලුත්වැඩියා සිදු කර භාවිතා කිරීමට හා කේබල් 01 මිලදී ගැනීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/v**

එන්.වී.සී.මහේෂි මිය භාවිතා කරනු ලබන ලැප්ටොප් පරිගණකය , SAMSUNG M2020 වගර්යේ මුද්‍රණ යන්ත්‍රය සහ දැනට ප්‍රසූත නිවාඩු ලැබ සිටින ඒ.ඩබ්.ආර්.ටී. කුමාරි මියගේ Epson M100 වගර්යේ මුද්‍රණ යන්ත්‍රය ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින අතර අලුත්වැඩියා කර ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/vi**

කායර්ාලයේ භාවිතා කරන KYOCERA ෆොටෝ කොපි මැෂිමේ සහ ඇඟිලි සලකුණු යන්ත්‍රය 2026 වෂර්ය සඳහා සේවා ගිවිසුම් ගත වීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/vii**

ආයතන ප්‍රධානින්ගේ උපදෙස් පරිදි පොළොන්නරුව ප්‍රාදේශීය සභා මගින් පාලනය වන පුස්තකාල සහ ආයුවෙර්ද සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර 04ක් වෙළඳ පොළ මිල සැඳහුම යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/viii**

පොළොන්නරුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කායර්ාලය සඳහා ග්‍රයින්ඩර් මැෂින් 01 , Portable Hard disk 01,රු. 20000.00 සීමාව යටතේ මිලදී ගැනීමටත් වැකුම් යන්ත්‍ර 05 ක් වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගැනිමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/ix**

ආයතන ප්‍රධානීන්ගේ උපදෙස් පරිදි පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා GPS යන්ත්‍ර 12ක් වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ජ02/1/x**

වත්කම් බදු දීම් විෂය නිලධාරී විසින් ඉල්ලුම් කර තිබු පහත සදහන් සභාවට අයත් වත්කම් 2026 වෂර්ය සඳහා බදු දීම සඳහා සිව්වන වරටත් දින 14ක් යටතේ මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

| වත්කම් නාමාවලිය | අවම ලංසු මුදල (මාසික ගාස්තුව) | ඇපතැම්පතු මුදල |
|---|---|---|

| | | |
|---|---|---|
| | | |
| සේවාගම සතිපොල | රු.5000.00 | මාස 03ක වාරික මුදලකට සමාන මුදලක් |
| ගල්ලැල්ල මාලු වෙලදසැල් අංක 01 | රු.12000.00 | මාස 03ක වාරික මුදලකට සමාන මුදලක් |
| ගල්ලැල්ල මස් වෙලදසැල් අංක 01 | රු.14000.00 | මාස 03ක වාරික මුදලකට සමාන මුදලක් |

**PPS/2026/01/26/ පී02/1/xi**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් රථ වාහන සදහා පූණර් රක්ෂණය කිරීම (2026 වෂර්ය) වෙනුවෙන් කැදවන ලද මිල ගණන්පත් සදහා ලංසු ඇගයීම් කමිටුව විසින් ලබා දුන් නිදෙර්ශය අනුමත කිරිමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ පී02/1/xii**

කායර්ාලයේ භාවිතා කරනු ලබන වායුසමීකරණ යන්ත්‍ර 2026 වෂර්යේ සේවා කිරීම වෙනුවෙන්, අවම මිල ගණන් 03ක් කැදවා ගිවිසුම්ගත වීමටත් ඉදිරි කටයුතු සිදු කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ පී02/1/xiii**

වත්කම් බදු දීම් විෂය නිලධාරී විසින් ලබා දී තිබූ ඉල්ලීම් ලිපිය අනුව පොලොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් සේවාගම වෙළද සංකීණර් ගොඩනැගිල්ල තෙවන වර ටෙන්ඩර් කැදවීම සිදු කලත් එක් බදුකරුවෙකුවත් ඉදිරිපත් නොවූ බැවින් ලක්ෂිත ක්ලෝතින් සොලුෂන් විසින් ඉල්ලුම් කර ඇති සේවාගම ගොඩනැගිල්ල මාස 06 ක් කුලී පදනම මත ලබා දීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ පී02/1/xiv**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව මගින් නිල ඇදුම් දීමනාව ලබා දෙන සේවකයින් සදහා (මාගර් කම්කරු,සෞඛ්‍ය කම්කරු) නිළ ඇදුමක් මසා දීම සදහා වෙළද පොළ මිල සැඳහුම් ක්‍රමය මගින් මිල ගණන් කැදවීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ පී02/1/xv**

කායර්ාලයේ සේවය කරන ස්ථිර සහ අනියම් සේවක මහත්ම මහත්මීන්ට සහ සභිකවරුන් සදහා නිල කමිසයක් (T shirt) ලබා දීම සදහා වෙළද පොළ මිල සැඳහුම් ක්‍රමය මගින් මිල ගණන් කැදවීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ පී02/1/xvi**

කායර්ාලයේ සේවය කරන ස්ථිර සහ අනියම් සේවක මහත්ම මහත්මීන් සදහා ඇමතුම් දින පොතක් ලබා දීම සුදුසු ක්‍රමවේදයක් යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ පී02/1/xvii**

පොළොන්නරුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කායර්ාලය සඳහා ටෝබාර් අඩි 15 දිග කේබලයක් සුදුසු ක්‍රමවේදයක් යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**PPS/2026/01/26/ඊ02/1/xviii**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කායර්ාලයේ වැසිකිළි වල සඳහා PVC ගලි බට 02ක් හදිසි අවස්ථාවක් ලෙස සලකා ප්‍රසම්පාදනයෙන් බැහැරව මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් නිදෙර්ශ අනුමත කිරිමට සභාව තීරණය කරන ලදි.

**2. සැලසුම් කමිටු වාතර්ාව ඉදිරිපත් කිරිම - පවත්වා නොමැත**

**උ 1. 2025 දෙසැම්බර් මස ආදායම් වියදම් වාතර්ාව පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරිම.**
**2026/01/26/උ/1**

2025 දෙසැම්බර් මස ආදායම් වියදම් වාතර්ාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව, එම වාතර්ාව සභාවේ අනුමත කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.යූ.පාලිත කහඳ ලියනගේ මැතිතුමා විසින් යෝජනා කල අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සුසන්ත ඉරෝෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව සභා සම්මත කරන ලදි.

**ඌ වෙනත්**

එච්.ජී.ජී වසන්ත කුමාර ,
සභාපති.
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.